**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :-02/2001**

මගේ අංකය :- IV/2/9/361/8එච්III/III
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2001.01.16

අමාත්‍යාංශ ලේකම්වරු
පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 19:5 වගන්තිය**
**යටතේ වූ විනය පරීක්ෂණ නිලධාරී නාම ලේඛනය**

"රාජ්‍ය නිලධාරීන්ගේ විනය පාලනය - ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩය'' යන මැයින් වූ 1999.10.29 දිනැති 23/99 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මගින් 1999.11.01 දින සිට බලාත්මක කරන ලද ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 19:5 වගන්තිය අනුව රාජ්‍ය පරිපාලන විෂයභාර ලේකම් විසින් විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයක් නඩත්තු කළ යුතුව ඇත.

02. එම සංචිතයට අදාල නාමලේඛනය නිකුත් කරන තෙක් පහත දක්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් නිකුත් කර ඇති විනය පරීක්ෂණ නිලධාරී නාම ලේඛණවල නම සඳහන් නිලධාරීන්ගෙන්, මාණ්ඩලික නිලධාරියෙක් වශයෙන් දස වසරක හෝ ඊට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 19:6 වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා තවදුරටත් යොදා ගත යුතුය.

| දිනය | චක්‍රලේ' අංකය |
|---|---|
| 1994.11.02 | 35/92(I) |
| 1997.11.13 | 35/92(III) |
| 1998.08.24 | 35/92(V) |
| 1999.05.17 | 5/99 (I) |
| 1999.08.16 | 5/99 (II) |
| 2000.01.14 | 5/99 (III) |
| 2000.05.23 | 5/99 (IV) |

03. 1995.06.26 දිනැති 35/92(II) හා 1997.11.13 දිනැති 35/92(IV) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන්හි නම් සඳහන් නීතිඥවරුන්ට විනය පරීක්ෂණ නිලධාරීන් වශයෙන් තවදුරටත් කටයුතු කළ හැකිය.

04. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 19:5 වගන්තිය යටතේ නව නාම ලේඛණය නිකුත් කරන තෙක් මෙම විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

එම්.එන්.ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.